විගණකාධිපති

GSMB Technical Services (Pvt) Ltd
11034
16 MAY 2024
RECEIVED
Finance Division

පිටපත් :- 1. ලේකම්, පරිසර අමාත්‍යාංශය

2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. } අයිඩබ්ලිව්එම්/සි/ජීඑස්එම්බීටීඑස්/1/2 } ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 මැයි 09 දින

සභාපති,

ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම හා රඳවාගත් ඉපයුම් පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි 17.19 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 90,853,735 ක් වූ ජංගම නොවන වත්කම් අයිතම 1109 ක් සමාගම විසින් අඛණ්ඩව භාවිතයට ගෙන තිබුණද මූල්‍ය

ප්‍රකාශනවල සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම සඳහා වත්කම්වල ඵලදායී ජීවිත කාලය හා සුන්බුන් වටිනාකම නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මනම්පිටිය වැලි ව්‍යාපෘතියේ රාජ්‍යභාග හා බලපත්‍ර ගාස්තු වියදම රු.86,352,396 ක් වුවද එම වියදම රු.78,072,349 ක් ලෙස රු.8,280,047 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම නිසා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2022 ජූලි 10 දින සිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවති කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට වැලි තොගයක් නොමැති වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.10,603,916 ක වැලි තොග වටිනාකමක් දක්වා තිබුණි. ඒ හේතුවෙන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම තොග ඌණතාවය සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් සමාගමට ලැබිය යුතු රු.6,679,175 ක හා සමාගම විසින් කාර්යාංශයට ගෙවිය යුතු රු.1,487,602 ක ශේෂ දක්වා තිබුණද කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශය විසින් සමාගමට ගෙවිය යුතු ශේෂයක් දක්වා නොතිබුණු අතර සමාගමෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු.26,928,891 ක් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත්, නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබෙනම් ඒවා ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) සහ (ඇ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත	ආගණනය කරනු ලැබූ පාරිතෝෂිකයන් සේවය අවසන් කිරීමේ දින සිට දින 30 ක කාලයක් ඇතුළත ගෙවිය යුතු වුවත් 2023 ජනවාරි 31 දින සේවය අවසන් කළ භූ විද්‍යාඥයෙකුට ගෙවිය යුතු රු.146,690 ක් වූ පාරිතෝෂික මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවා නොතිබුණි.
(ආ) 2023 සැප්තැම්බර් 27 දිනැති 01/2021(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8 ඡේදය	(i) චක්‍රලේඛ ප්‍රකාරව පරිපාලිත සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා කොන්ත්‍රාත් පදනම මත පත්කළ යුතු වුවත් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා 2023 සැප්තැම්බර් 15 දින සිට ස්ථිර පදනම මත පත්කර තිබුණි. (ii) සමාගම මව් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ පරිපාලන හා මූල්‍ය අත්පොතක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව පිළියෙල කළ යුතු වුවත් මේ දක්වා පිළියෙල කර නොතිබුණි.
(ඇ) 2022 ඔක්තෝබර් 06 දිනැති අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	වයස අවුරුදු 63 ක නිලධාරියෙකු සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස 2023 සැප්තැම්බර් 01 වන දින කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන 2023 ඔක්තෝබර් 23 වන දින ස්ථිර කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුල අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

(අ) සේවය අවසන් කර තිබූ සේවකයන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.114,579 ක් වූ ආපදා ණය වාරික හා පොලී අයකර ගැනීමට විගණිත දින එනම්, 2024 මාර්තු 31 වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) රු.31,367,131 ක් වූ වෙළඳ ලැබිය යුතු ශේෂ තුළ වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ පවතින එකතුව රු.4,136,387 ක් වූ ශේෂ 86 ක් වූ අතර වර්ෂ 5-10 අතර කාලයක සිට පවතින එකතුව රු.6,837,177 ක් වූ ශේෂ 78 ක් විය. මෙම ශේෂ අයකර ගැනීමට විගණිත දින එනම්, 2024 මාර්තු 31 වන විටද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017-2023 කාලය තුළ විවිධ ව්‍යාපෘති සේවා ලබා ගැනීම සඳහා ආයතන හා පුද්ගලයන් 149 ක් විසින් එකතුව රු.9,688,220 ක් වූ අත්තිකාරම් සමාගම වෙත ගෙවා තිබුණු අතර ඒ තුළ වසර 5 ඉක්මවූ රු.3,000,636 ක් වූ අත්තිකාරම් ශේෂ 47ක් විය. මෙම අත්තිකාරම් විගණිත දින වූ 2024 මාර්තු 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) **කන්තලේ වැලි කැණීම හා ගං ඉවුර සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය**
කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුරියපුර ග්‍රාම නිලධාරී වසමේ මහවැලි ගඟේ ආරක්ෂණ වේල්ලට තර්ජනයක් වන පරිදි තැන්පත් වී ඇති කියුබ් 103,128 ක් වූ වැලි නිධිය ඉවත් කිරීම සඳහා 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සමාගම වෙත පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ව්‍යාපෘතිය 2022 ජූලි 10 වන දින සිට නතර කර තිබූ අතර කිසිදු වැලි කැණීම් කටයුත්තක් සිදුකර නොතිබියදී 2022 අගෝස්තු 01 වන දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.4,773,910 ක වැටුප්, දීමනා, ගෙවල් කුලී, කාර්යාල වියදම්, ගමන් වියදම් යනාදී වියදම් දරා තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ රු.168,254,363 කට මහවැලි ගඟේ බාදන වාරක 03ක් ඉදිකිරීමට සමාගම සැලසුම් කර තිබුණි. එක් බාදන වාරකයක් පමණක් ඉදිකර අවසන් කර තිබූ අතර ඉතිරි බාදන වාරක 02 හි ඉදිකිරීම් ප්‍රගතිය පිළිවෙලින් සියයට 75 හා 54 ක් විය. මෙම බාදන වාරක ඉදිකිරීම්වල ගිවිසුම් කාලය මේ වන විට ඉක්මවා ඇති අතර, බාදන වාරක 02 හි වැඩ අවසන් කර නොමැති බැවින් ගංවතුර තත්ත්වයන් වලදී මහවැලි ගඟේ වේල්ලට හානි සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ඉ) සමාගම ක්‍රියාත්මක කර තිබුණු මුතුර් වැලි ව්‍යාපෘතියේ කැණීම් කටයුතු 2022 අප්‍රේල් මස සිට නතර කර තිබුණු අතර කිසිදු වැලි කැණීම් කටයුත්තක් සිදු නොකර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.1,569,372 ක වැටුප්, දීමනා, ඉන්ධන, විදුලිය, ගෙවල් කුලී යනාදී වියදම් දරා තිබුණි.

(ඊ) 2017 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කළ කොටිකම්බොක්ක තිරුවානා නිධිය කැණීමේ ව්‍යාපෘතියේ කැණීම් කටයුතු විගණිත දින වන 2024 මාර්තු 31 වන විටත් ආරම්භ කර කර නොතිබුණු අතර පරිපාලන වියදම්, මිනුම් කටයුතු, ස්ථාවර වත්කම් මිලට ගැනීම සහ සේවක වැටුප් ගෙවීම් වෙනුවෙන් 2017 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.24,823,325 ක වියදම් දරා තිබුණි. උක්ත ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට පෙර 2017 වර්ෂයේදී රු. මිලියන 2.2 කට මිලදී ගන්නා ලද පාලම් තරාදිය (Weigh bridge) නිෂ්කාර්ය වත්කමක් බවට පත්ව තිබූ අතර 2019 වර්ෂයේදී තරාදිය ක්‍රමාංකනය කිරීම

සඳහා එහි විද්‍යුත් උපාංග තරාදිය මිලදී ගත් සමාගම විසින් ඉවත් කරගෙන නැවත සමාගම වෙත ලබාදී නොතිබුණි.

(උ) රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජවක රක්ෂිතය තුල පවතින කැල්සයිට් නිධිය කැණීම් කර අගය එකතුකර අපනයනය කිරීමත්, දේශීය වශයෙන් භාවිත කිරීමත් අරමුණු කරගෙන ව්‍යාපෘතියක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව සිදුකිරීම සඳහා 2020 වර්ෂයේ සිට සැලසුම් කර තිබුණි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට උපදේශන සේවා ගාස්තු ගෙවීම, ප්‍රවාහන, ගමන් වියදම්, සංයුක්ත දීමනා පරීක්ෂණ ගාස්තු යනාදී සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට සමාගම රු.3,304,612 ක වියදම් දරා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

(ඌ) කන්තලේ සිරිමංගලපුර වැලි විකුණුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා 2023 ජූනි මස සිට සේවකයන් 06 දෙනෙකු අනුයුක්ත කර වැටුප් හා චිත්තන, ඉන්ධන, ගෙවල් කුලී, සුභසාධක, විදුලිය යනාදිය සඳහා රු.1,764,297ක වියදම් දරා තිබුණද ව්‍යාපෘතිය නවතා දැමීමට 2024 ජනවාරි මස තීරණය කර තිබීම හේතුවෙන් දරන ලද වියදම් නිෂ්කාර්ය වී තිබුණි.

(එ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපතිවරයා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවැත්වෙන දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 28 වන සමුළුවට (COP 28) සහභාගී වීම සඳහා නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත රු.884,231ක මුදලක් ලබා දෙන ලෙස 2023 නොවැම්බර් 30 දින ප්‍රධාන විධායක නිලධාරී වෙත කළ දැනුම් දීම මත අදාල මුදල 2023 දෙසැම්බර් 04 දින ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර අලෙවි සමාගමට ගෙවා තිබුණි. මේ සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී නොතිබුණු අතර ජනාධිපති ලේකම් විසින්ද මෙම විදේශ සංචාරය සඳහා අනුමැතිය ලබාදී නොතිබුණි. සමාගම මෙම මුදල විගණිත දින වූ 2024 මාර්තු 31 විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ඒ) **ක්‍රියාකාරී සැලසුම හා කාර්යසාධනය**

(i) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමට සමාගමේ මානව සම්පත් අංශය, අලෙවි අංශය සහ සැලසුම් අංශය යන අංශවල කාර්යභාරයන් ඇතුලත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සමාගම වැලි විකුණුම් වලින් රු.2,417,000,000 ක හා කැණීම් හා භූ විද්‍යාත්මක ව්‍යාපෘති වලින් රු.159,000,000 ක ආදායම් උපයා ගැනීමට ඉලක්ක කර තිබුණද උපයාගෙන තිබුණේ පිළිවෙලින් රු.27,316,991 ක් හා රු.62,797,518 ක් වූ සියයට 1.1 ක හා සියයට 39.5 ක ආදායම් පමණි. සමාගමේ ආදායම් වර්ධනය කර ගැනීම සඳහා උපායමාර්ග හඳුනාගෙන හා අලෙවිකරණ සැලසුමක් සකස් කර නොතිබුණි.

(ඔ) මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතිය සතු රු.8,883,520 ක් වටිනා ලෝඩර් යන්ත්‍රය 2017 ජූලි 16 දින සිට අක්‍රීයව තිබුණු අතර යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) පිරිවැය රු.104,650 ක් හා රු.567,000 ක් වූ මෝටර් සයිකලයක් හා බහාළුමක් 2014 වර්ෂයේ සිට අස්ථානගතවී ඇති බවට සමාගම හඳුනාගෙන තිබුණද ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) **අලෙවිකරණ හා සැලසුම් කලමනාකරු තනතුර**

සමාගමේ අලෙවිකරණ සහ සැලසුම් කළමනාකරු තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා 2023 සැප්තැම්බර් 19 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබුණි. එසේ වුවද උක්ත තනතුර සඳහා 2024 පෙබරවාරි 08 විගණිත දින වන විටත් බඳවා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. මේ අනුව මෙම තනතුරෙහි සැලසුම් කළමණාකරණ තනතුර ලෙස අනුමත කාර්ය මණ්ඩලයෙහි ඇතුළත් නොවූ තනතුරක් ඇති කර ඒ වන විට සිටි නිලධාරිනියක 2023 ඔක්තෝබර් 09 දින ස්ථිර පදනම මත පත්කර තිබූ අතර එකී පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

(ග) සමාගම 2023 ඔක්තෝබර් 09 දින සිට බලපැවැත්වෙන පරිදි 35 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් ස්ථිර කර තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සේවකයන් ස්ථිර කිරීමේදී සියළුම අභ්‍යන්තර සේවකයින් වෙතින් අයදුම්පත්‍ර ලබා ගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඒවා ඇගයීමට ලක්කර සුදුසු අයදුම්කරුවන් තෝරා ගෙන ස්ථිර කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. අංශ මට්ටමින් එහි ප්‍රධානීන් විසින් අධ්‍යාපනික සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳව සැලකිල්ලට නොගෙන රාජකාරී දැනුම හා නිමවුමේ ගුණාත්මය, විශ්ලේෂණාත්මක සැලසුම්කරණය හා සංවිධානාත්මක කුසලතා, සන්නිවේදන කුසලතා, වැඩ පිළිබඳ ආකල්පය, සාමූහික ක්‍රියාකාරකම්, වගකීම, තීරණ ගැනීම, නායකත්ව හැකියාව යනාදී ප්‍රමාණනය කළ නොහැකි ගුණාත්මක ලක්ෂණ පමණක් ඇගයීම් නිර්නායක ලෙස තෝරා ගෙන තිබුණි. මේ නිසා අංශ ප්‍රධානීන්ට තම අභිමතය පරිදි කටයුතු කිරීමට අවස්ථාව ලැබීම තුළින් සාධාරණ පදනමට ඇගයීම සිදු කර තිබුණේ ද යන්න තහවුරු නොවීය. මේ නිසා 2008, 2012 හා 2013 වර්ෂවල කොන්ත්‍රාත් පදනමට බඳවා ගත් සේවකයින් ස්ථිර නොකර ඊට පසු වර්ෂවල කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් ස්ථිර කර තිබුණි.

(ii) ස්ථිර සේවයට බඳවා ගැනීම සඳහා කාර්යසාධන ඇගයීම් ක්‍රියාපරිපාටිය නිසි අයුරින් සිදුකර ඇති බවත් සම්මුඛ පරීක්ෂණ වලට හාජනය කර තෝරා ගත් බවත් සඳහන් කර 2023 සැප්තැම්බර් 21 දින පැවති 182 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණ ද සම්මුඛ පරීක්ෂණ පවත්වා නොතිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජී.එස්.එම්.බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම
ஜி.எஸ்.எம்.பி டெக்னிக்கல் சேவிசஸ் (பிரைவேட்) லிமிட்டட்
GSMB TECHNICAL SERVICES (PVT) LTD

පරිසර අමාත්‍යාංශය
නො.569, එපිටමුල්ල පාර
පිටකෝට්ටේ

சுற்றாடல் அமைச்சு
இல.569, எபிடமுல்ல வீதி,
பிட்டகோட்டை

Ministry of Environment
No.569, Epitamulla Road,
Pitakotte

දුරකථන අංක
தொ.பே. இல
Telephone No
0112 824 025
0112 827 850

වෙබ් අඩවිය
வலை தளம்
Web Site
www.gsmbts.gov.lk

ෆැක්ස්
தொலைநகல்
Fax
0112 854 764

2024.06.19

මගේ අංකය : - ජී.එස්.එම්.බී.ටී.එස් /ඒ.ආර්.එෆ්/1/2023
ඔබගේ අංකය : - අයිඩබ්ලිව්එම්/ඕ/ජීඑස්එම්බීටීඑස්/1/23

රජයේ විගණක,
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,
නො.569,
එපිටමුල්ල පාර,
පිටකෝට්ටේ.

මහත්මයාණෙනි,

ජී.එස්.එම්.බී.තාක්ෂණික සේවා පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් හා අදහස් දැක්වීම් මේ සමඟ ඉදිරිපත් කරමි.

.....

ආචාර්ය එස්.එම්.ඒ. කිත්සිරි මංචනායක
සභාපති
ජී. එස්. එම්.බී.ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගම

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම් ප්‍රමිතියට අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ දී අදාල වත්කම් පන්තියම ප්‍රත්‍යාගනනය කලයුතු බැවින් ඒ සඳහා යන මූල්‍ය පිරිවැය , කාලය හා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම තුළ ආයතනයට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ සලකා බලා මෙම කාර්ය සිදු කර නොමැත. එමෙන්ම වත්කමෙහි ධාරණ අගය හා සාධාරණ අගය අතර ප්‍රමාණාත්මක වෙනසක් නොපවතින බවට උපකල්පනය කර ඇත.

එමෙන්ම වර්තමානයේ ගිණුම්කරණ ප්‍රමිත සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදු නොකරන බව (2018/12/31/ දිනැති භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 4/2018 අනුව) රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව අප වෙත දැනුම් දී ඇති අතර වත්කම් ප්‍රත්‍යාගණනය කල හැකි වෙනත් පුද්ගලික ආයතන පවතින්නේ ද යන්න විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් විමසූ විට ද ඊට නිසි පිළිතුරු නොලැබුණි.එමෙන්ම වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීමට ප්‍රාමාණික අවබෝධයක් සහිත පිරිසක් ආයතනය තුල නොමැත.

කොටස් වෙළෙඳපොළෙහි ලියාපදිංචි සියලු සමාගම් සතුව මෙලෙස සම්පූර්ණ ක්ෂය කරන ලද වත්කම් පවතින අතර එම සෑම වත්කමක්ම ප්‍රත්‍යාගණනය කිරීම ඔවුන් ප්‍රායෝගිකව සිදු නොකරයි. මෙලෙස අණපනත් බහුතරයකින් පාලනය වන සීමිත පොදු සමාගම් 100% ප්‍රත්‍යාගණනය නොකරන පසුබිමක කුඩා ව්‍යාපාර සඳහා ගිණුම්කරණ කටයුතු සිදුකරන ඉතා කුඩා සමාගමක් ඒ සඳහා අනුගත වීමට දරණ උත්සාහය අගය කල හැකි දෙයක් වුවත් ප්‍රතිලාභයක් නොමැත. මේ පිළිබඳ ගිණුම්කරණ ප්‍රමිත අංක 3.07.d හි පැහැදිලි කිරීමක් දැනටමත් සිදුකර ඇති අතර ගිණුම් සටහන් අංක 12.3 ඔස්සේ තවදුරටත් හෙලිදරව් කිරීමක් සිදු කර ඇත.

(ආ) ඔබ විසින් යොමු කරන ලද විගණන විමසුමෙහි මනම්පිටිය ව්‍යාපෘතිය පාදක කරගෙන රාජ්‍ය භාගය හා බලපත්‍ර ගාස්තුව ගණනය කර ඇත. නමුත් මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස දක්වා ඇති ශේෂය පහත පරිදි සාරාංශ කළ හැකිය.

අපගේ මූල්‍ය ප්‍රකාශනවල මනම්පිටියට අදාල වියදම රු.76,659,980 /=ක් වේ. මෙහි වෙනස රු.9,692,416/= ක් වන අතර එයට හේතුව 2022 වර්ෂයට අදාලව අප විසින් වෙන් කර ඇති අධිවෙන් කිරීම ගැලපීමයි.

රාජ්‍ය භාගය හා බලපත්‍ර ගාස්තුව (රු.)

මනම්පිටිය	86,352,369
2022 වර්ෂයේ අධි/ඌණ වෙන් කිරීම	(9,692,416)
මනම්පිටිය මුළු රාජ්‍ය භාගය හා බලපත්‍ර ගාස්තු	76,659,980
කෑගල්ල මාඔය (බලපත්‍ර ගාස්තු)	127,931
මනම්පිටිය අදියර 02 (බලපත්‍ර ගාස්තු)	1.165,455
කොටිකම්බොක්ක (බලපත්‍ර ගාස්තු)	118,983
මුළු රාජ්‍ය භාගය හා බලපත්‍ර ගාස්තු	**78,072,349**

(ඇ) 2024 මාර්තු 18 දින පැවති අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවෙහි නිර්දේශ මත හා 46 වන අභ්‍යයන්තර විගණන හා කළමනාකරණ කමිටුවෙහි නිර්දේශ මත මුදල් රෙගුලාසි 103 හා 104 අනුව කන්තලේ සූරියපුර වැලි කැණීම් ව්‍යාපෘතියේ තොගයේ ඌණතාවය සම්බන්ධව 2023.05.09 වන දින නිකුත් කරන ලද විමර්ශන වාර්තාව පදනම් කරගනිමින් මූලික විමර්ශනයක් සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදි. එම මූලික විමර්ශන වාර්තාව සභාපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි.

මූලික විමර්ශනය අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා 2024.05.27 දින කළමනාකරණ රැස්වීමේ දී තාක්ෂණික කමිටුවක් සභාපතිතුමා විසින් පත් කල අතර එම කමිටුව වෙත 2024.06.05 දින මැමයක් මඟින් ඉදිරි විමර්ශන කටයුතු සිදු කරන ලෙස දන්වා ඇත .

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.1,487,602/= ක වටිනාකම මනම්පිටිය ව්‍යාපෘතියට අදාලව නොවැම්බර් සහ දෙසැම්බර් මාසය සඳහා ගෙවීමට ඇති ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව වන අතර කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.26,928,891/= ක මුදලක් අප විසින් කාර්යාංශය වෙත ගෙවීමට නොමැත.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2 නීතිරීති / විධානයට යොමුව

(අ) 2023 ජනවාරි 01 දින සේවය අවසන් කල භූ විද්‍යාඥයෙකුට ගෙවිය යුතුව තිබූ පාරිතෝෂික මුදල

මෙම නිලධාරියාට ගෙවීමට කටයුතු කර ඇත.

(ආ) I. චක්‍රලේඛ ප්‍රකාරව පරිපාලිත සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා කොන්ත්‍රාත් පදනම මත පත්පත් කල යුතු වුවත් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ස්ථිර පදනම මත පත් කිරීම.

ආයතනයේ 2023 ඔක්තෝබර් මාසයේ 09 වන දින තෙක් ස්ථිර සේවක පිරිසක් නොසිටිය අතර මෙම නිලධාරියාගේ මුලිකත්වයෙන් 2023.10.09 දින සේවාකයින් 39 කට ස්ථිර පත්වීම් ලබා දෙන ලදී. කෙසේ වෙතත් මින් ඉදිරියට ආයතනයට බඳවා ගැනීමේ පටිපාටිය සඳහා (SOR) මව් ආයතනයේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ඇති බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය දන්වා ඇත.

II. පරිපාලන හා මූල්‍ය අත්පොත

දැනට මානව සම්පත් හා පරිපාලන අංශයට අදාල අත්පොතක් සකස් කරමින් පවතින අතර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් එය අනුමත කර ගැනීමට බලාපොරොත්තු වේ.

(ඇ) වයස අවුරුදු 63 ක නිලධාරියෙකු සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කිරීම එවකට පරිසර අමාත්‍යවරයා ලෙස කටයුතු කල නසීර් අහමඩ් මහතා විසින් එම කාලයේදී සභාපතිවරයා ලෙස සේවය කල ආර.සන්ජීපන් මහතා හට ලිපියක් මගින් අහමඩ් ඉක්බාල් හසන් මහතා ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලෙස දැනුම්දී ඇති අතර ඒ අනුව සභාපතිවරයා විසින් මෙම පත්වීමේ ලිපිය ලබාදී ඇත.

කෙසේ වෙතත් ප්‍රධාන විධායක නිලධාරීවරයා 2024.05.30 දින සිට සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

3.වෙනත් කරුණු

(අ) කේ.එස්.ආර්.ඇන්තනී යන අයගෙන් රු.94,843.70 ක මුදල අයකර ගැනීමට නීතිමය පියවර ගැනීම සඳහා නීති අංශය වෙත අදාල තොරතුරු ලබා දී ඇති අතර එ.ඒ.එන්.පී.අමරසිංහ යන අයගෙන් අය කර ගැනීමට ඇති රු.19,739.92 ක මුදල ඔහුගේ පාරිතෝෂික මුදල ප්‍රමාණවත් වේ.

(ආ)

Year	Debtor as at 31/12/2021	Debtor as at 31/12/2022	Debtor as at 31/12/2023	Debtor as at 14/06/2024
2024	-	-	-	13,268,092
2023	-	-	9,575,084	1,373,410
2022	-	12,708,469	432,300	432,300
2021	16,071,791	118,554	-	-
2020	3,026,519	2,580,005	2,411,190	2,411,190
2019	7,830,799	7,541,297	4,770,962	4,753,662
2018	4,747,183	4,467,121	4,088,263	4,088,263
Over 2018	19,420,475	18,367,732	10,973,564	10,933,056
Total	**51,096,767**	**45,783,179**	**32,251,362**	**37,259,972**
GSMB	9,965,067	6,686,025	884,231	884,231
Excluding GSMB	41,131,700	39,097,154	31,367,131	36,375,741

මෙම ශේෂ 2024 මූල්‍ය වර්ෂ වලදී නිරවුල් කරගැනීමට කටයුතු කරනු ලබන අතර පෙර වර්ෂ වලට සාපේක්ෂව ශේෂ කිහිපයක් 2023 මූල්‍ය වර්ෂය තුලදී නිරවුල් වී ඇත.

(ඇ) 2010-2023 කාලය තුල පවතින රු.9,688,220/= ක ශේෂයෙන් වසර 05 කට වැඩි අත්තිකාරම් ශේෂය රු. 3,000,635.66 ක් වේ.

මෙම වසර 05 තුළ මේ වන විට පවතින අත්තිකාරම් 2024.01.11 පැවති Board Paper No.GSMBTS/185/15 අංක දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් එම අත්තිකාරම් මුදල් ආදායම් ලෙස ගැනීමට අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල විසින් නැවත විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදි. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර කිහිපයකදී ද මෙම අත්තිකාරම් මුදල් ආදායම් ලෙස ගැනීමට උපදෙස් හා නිර්දේශ ලබා දී තිබුනද, නැවතත් ඉදිරි කමිටු රැස්වීම් වාරයේ දී මෙය ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදි.

(ඇ) කන්තලේ වැලි කැණීම් හා ගං ඉවුර සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය

I. එම ව්‍යාපෘතියට අනුයුක්ත කර ඇති සේවකයන් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතිය වෙත අනුයුක්ත කර ඇති අතර, ව්‍යාපෘතියේ වියදම් උපරිම වශයෙන් සීමා කර ඇත.

II. ජාතික අවශ්‍යතාවයකට අනුව නිර්මාණය කෙරෙනු කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වුයේ, ගංවතුර පාලනය වෙනුවෙන් බාදන වාරක ඉදිකිරීම හා එම ප්‍රදේශයේ තැන්පත් වී ඇති වැලි නිධි ඉවත් කිරීම තුලින් ගංවතුරින් ප්‍රදේශයට වන බලපෑම අවම කිරීමයි. කෙසේ වෙතත් රාජ්‍ය ආයතනවලින් එම ව්‍යාපෘතියට අවශ්‍ය අවසරයන් ලැබීමට ප්‍රමාද වීම නිසා බලපත්‍ර ලබා ගැනීම ප්‍රමාද වී ඇත.

කෙසේ වෙතත් ආයතනය සතු කන්ටේනර් බහාලුම් හා උපකරණ එම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ භූමියේ ස්ථාපනය කර ඇති නිසා, ඒවායේ ආරක්ෂාව වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තුමේන්තුවේ ආරක්ෂාව ලබා ගෙන ඇත. ඊට අවශ්‍ය අවසරය ලබා දෙන ලෙස ඉල්ලීම් කරමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත සිහිකැඳවීම් ලිපි කිහිපයක්ම ඉදිරිපත් කර ඇත.

මෙලෙස ඉල්ලීම් කිහිපයක්ම ඉදිරිපත් කිරීමෙන් පසු 2024.01.09 දින මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයා විසින් දෙපාර්තුමේන්තුවට යොමු කරන ලද DDG/TS/GEN/35 අංක දරන ලිපිය මඟින් මෙම ව්‍යාපෘතියේ වැදගත්කම දක්වමින්, එම ව්‍යාපෘතියට වනජීවී දෙපාර්තුමේන්තුවෙන් අවශ්‍යය අවසරය ඉල්ලා ඇත.

ඊට පිළිතුරු ලෙස 2024.02.12 දින වනජීවී දෙපාර්තුමේන්තුව විසින් යොමු කරන ලද වජී/06/01/02/819 අංක දරණ ලිපිය මඟින් ව්‍යාපෘතියට අවසරය ලබා දී ඇත. කෙසේ වෙතත් ඉඩම් පරිහරණය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අවසරය ලබා නොදීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු නතර වී ඇත.

බාදන වාරක ඉදි කිරීමේ ප්‍රගතිය හා ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

වර්ෂය	2019	2020	2021	2022	සමස්ථ ප්‍රතිශතය
කැණීම් කල කියුබ් ප්‍රමාණය	22,154.85	24.151.19	0	9839	
කැණීම් කල කියුබ් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස	21%	23%	0%	9.50%	53.6%
බාදන වාරක ඉදිකිරීම් ප්‍රතිශතය	42%	33%	0%		75%

ආයතනය වැලි කැණීම සඳහා ඉල්ලුම් කල වැලි ප්‍රමාණයන්ගෙන් 53.6% පමණක් කැණීම් කිරීම සිදු කර ඇති අතර, බාදන වාරක ඉදිකිරීම 75% පමණ නිමකර ඇත. මෙහි ඉදිරි කටයුතු ද නිමකර මෙම ව්‍යාපෘතිය අවසන් කරලීම වෙනුවෙන් ආයතනය කටයුතු කරන ලද අතර, ඊට අවශ්‍යය රාජ්‍ය ආයතනවල අවසරය ලැබුනු සැනින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ.

(ඉ) ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම මුතූර් වැලි ව්‍යාපෘතිය උපකොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දීම සිදු වූ කාලය තුල රට තුල විශාල ඉන්ධන හිඟයක් සහ ආර්ථික අර්බුධයක් පැවති අතර එම කාලය තුල රටේ සෑම ඉදිකිරීම් ක්ෂේත්‍රයකම කඩා වැටීම සිදු වී ඇත. සමාගමේ සේවකයින් තිදෙනෙකු වෙනුවෙන් මෙම කාලය තුල වියදම් දැරීමක් සිදු නොකර, ඔවුන් ඉවත් කර නැවත සේවයේ යෙදවීමට සිදු වුවහොත් වැයවන පිරිවැය මීට වැඩි විය හැක. රටේ පැවති ඉන්ධන අර්බුධය සහ ආර්ථික අර්බුධය සම්බන්ධව නිහමනයකට එළඹීමට නොහැකි නිසා ඔවුන් සේවයේ යෙදවීම සිදු වූවා විය හැක. මෙය ආයතනයේ මෙන්ම මුළු රටේම ඉදි කිරීම් සේවාව තුල පැවති ගැටළුවක් විය.

මුතූර් වැලි ව්‍යාපෘතිය සඳහා වියදම් පිරිවැය සිදු වූවායැයි නිහමනය කල හැකි අතර, රටේ පැවති ආර්ථික අර්බුධය අවසන් වීමෙන් පසුව මෙම ව්‍යාපෘතිය මාස 03ක වැනි කාලයක් පවත්වාගෙන ගියේ නම් මෙම කොන්ත්‍රාත්කරුවන් සමඟ පැවති එකඟතාවයට අනුව ඉහත ලැබූ අලාභය පියවා ගැනීමට හැකියාව සහ පවතින වැලි කියුබයක් සඳහා ගෙවිය යුතු මුදලත් අය කරගතව පැවතුණි.

(ඊ) කොටිකම්බොක්ක තිරුවානා නිධිය කැණීම් ව්‍යාපෘතිය

I. කොටිකම්බොක්ක කැණීම් ව්‍යාපෘතියේ කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් මූලික පාරිසරික ඇගයීම් වාර්තාවක් සකස් කිරීමට නිර්දේශ වූ අතර, මෙලෙස මූලික පාරිසරික ඇගයීම් වාර්තාවන් සකස් කර 2018 වර්ෂයේ එම වාර්තාව ඉදිරිපත් කෙරුනු අතර, රාජ්‍ය ආයතන වල නිර්දේශ මත එහි සංශෝදන ගණනාවක් සිදු කිරීමට සිදු විය.මෙලෙස අවසාන වශයෙන් 2022 වර්ෂයේ ඉදිරිපත් කෙරුනු මූලික පාරිසරික ඇගයීම් වාර්තාවට අනුමැතිය 2022.10.20 දින ලැබුනු අතර, ඊට අදාලව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා ආයතනය යොමු වී ඇත.

ඉතා පරිසර සංවේදී කලාපයක් තුල පිහිටා ඇති මෙම තිරුවානා නිධිය කිරීම සම්බන්ධයෙන් විවිධ ආයතන මගින් තිරසාර ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම වෙනුවෙන් කලින් කලට විවිධ නිර්දේශ ලබා දුන් අතර, ඊට අදාලව කටයුතු කිරීමට ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් ආයතනයට සිදු වුව ද, මේ වන විට ව්‍යාපෘතියේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩිනම් කර ඇත.

2023.09.27 ඉඩම් පරිහරණය හා කැණීම් බලපත්‍රය ලබා ගැනීම සඳහා නිර්දේශය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා ගන්නා ලදී.

ව්‍යාපෘතිය හා සම්බන්ධ වන ආයතන සමග කටයුතු කරමින් කැණීම් බලපත්‍ර සම්බන්ධව කටයුතු ආරම්භ කර ඇති අතර, පහත සඳහන් ලෙස එහි කටයුතුවල ප්‍රගතියක් ලබා ගෙන ඇත.

2023.10.13 දින කැණීම් බලපත්‍රය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ඉල්ලුම් කර ඇති අතර, එම ආයතනය මගින් ඊට අදාල නිර්දේශ ලබා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කර ඇති අතර, එම ආයතනය සමග සම්බන්ධ වෙමින් මෙම නිර්දේශ සම්බන්ධයෙන් පහත දක්වා ඇත.

- ❖ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව:- එම භූමිය තුල ඇති කැණීම් කිරීම සඳහා යෝජනා කර ඇති කොටසෙහි පුරා විද්‍යා වටිනාකමක් නොමැති බවත්, ඊට අදාල අනුමැතිය ලබා දිය හැකි බවත් දන්වා ඇත.
- ❖ මධ්‍යම පරිසර අධිකාරිය :- මූලික පාරිසරික ඇගයීම් වාර්තාව පාදක කර ගනිමින් ඊට අදාල නිර්දේශ ලබා දී ඇත.
- ❖ නාගරික සංවර්ධන අධිකාරිය :- අදාල නිර්දේශය ලැබී ඇත.

වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මගින් ඉඩම් පරිහරණය සඳහා වන අනුමැතිය මේ වන විටත් ලැබී ඇති නිසා බලපත්‍ර ලබාදීමට හැකියාව පවතින බව පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමන් ද සහභාගිව ප්‍රගති සමාලෝචන රැස්වීමේදි සාකච්ඡාවට බදුන් වූ අතර, ඒ අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් කඩිනමින් බලපත්‍ර නිකුත් කිරීමට එකඟතාවය පළකර ඇත.

(උ) කැල්සයිටි ව්‍යාපෘතිය ප්‍රායෝගික ගැටලු සහගතභාවය නිසා ඒම ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් වැය කිරීම සම්පූර්ණයෙන්ම නවතා දමා ඇති අතර, ඒම ව්‍යාපෘතියේ නිශ්කාර්යය වියදම් පිළිබඳව සොයා බැලීමට සහ ඉදිරි නිර්දේශ ලබා දීම සඳහා කමිටුවක් පත් කරන ලදි. එම කමිටුවේ නිර්දේශ ද මේ වන විට ලැබී ඇති අතර, මිළඟ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත එම වාර්තාව ඉදිරිපත් කර අධ්‍යක්ෂක මණ්ඩල තීරණ අනුව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ඇත.

(ඌ) ජනාධිපති කාර්ය සාධන බලකායේ නිර්දේශයන්ට අනුව GSMBTS මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ වැලි විකුණුම් මධ්‍යස්ථාන අතුරින් කන්තලේ සහ මඩකලපුව ව්‍යාපෘති ආරම්භ කිරීම පිළිබඳව 2023/08/01 දින විෂයභාර ඇමතිතුමා විසින් ලබාදුන් උපදෙස් අනුව කටයුතු කිරීමට 2023/05/29 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදි සාකච්ඡාවට ගෙන ඇති අතර එහිදි 2023/07/01 දින සිට අමාත්‍ය වරයාගේ උපදෙස් අනුව මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට උපදෙස් ලබාදි ඇත.

අදාල රාජ්‍ය ආයතනය ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය නිතීමය පසුබිම සකස් කර දීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වීම පිළිබඳව 2024/01/26 දිනැති අධ්‍යක්ෂක මණ්ඩලය වෙත කරුණු වාර්තා කර පසු ව්‍යාපෘතියේ කටයුතු නවතා දැමීමට අධ්‍යක්ෂක මණ්ඩලය උපදෙස් ලබාදි ඇත.

(එ) හිටපු ප්‍රධාන විධායක නිළධාරීතුමාගේ අත්සනින් යුතුව හිටපු සභාපතිතුමා වෙත විදේශ ගමන් බලපත්‍රය සඳහා ගෙවන ලද මුදල ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වා 2024.05.07 දින සිහිකැඳවීම් ලිපියක් යවා ඇති අතර එහි පිටපත් සභාපතිතුමාට සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාශයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට, ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂතුමාට (භූ විද්‍යා) හා මූල්‍ය අධ්‍යක්ෂතුමියට වෙත ද යවා ඇත. නමුත්, මේ වන තෙක් එම විදේශ ගමන් බලපත්‍රය සඳහා ගෙවන ලද රු.884,231/= ක මුදල නැවත ගෙවා නොමැත.

(ඒ) ක්‍රියාකාරී සැලසුම හා කාර්ය සාධනය

I. ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලබනුයේ අමාත්‍යාංශය මගින් එවන ලද ආකෘතියට අනුව වේ. එම ආකෘතියේ ඇතුලත් කොට ඇත්තේ ආදායම් උත්පාදන අංශයන් පමණි. ඉදිරියේ දී ඉහත සඳහන් අංශයන් සඳහා අදාල කාර්යභාර්යන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කරනු ඇත.

II.

- කෑගල්ල වැලි විකිණුම් මධ්‍යස්ථානය ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ආදායම වන රුපියල් මිලියන 71.44 ක ඉලක්කය කරා යාමට අපෙක්ශා කල අතර ආර්ථික අර්බුදය හමුවේ පාඩු ලබන තත්වයේ පැවති හෙයින් එම වැලි විකිණුම් මධ්‍යස්ථානය වසා දමන ලදී. ඒ වන විට එම වැලි විකිණුම් මධ්‍යස්ථානය විසින් ලබා ගෙන තිබූ ආදායම රුපියල් මිලියන 0.38 කි.

- යක්කල වැලි විකිණුම් මධ්‍යස්ථානය ආර්ථික අර්බුදය හමුවේ පාඩු ලබන තත්වයේ පැවති හෙයින් රුපියල් මිලියන 177.11 ක අපේක්ෂිත විකිණුම් ධාරිතාවය කරා ලගාවිය නොහැකි විය. 2023 වර්ශය තුල මෙම විකුණුම් මධ්‍යස්ථානය මගින් ලභා කර ගත හැකි වූයේ රුපියල් මිලි. 5.12ක් පමනි

- අධ්‍යක්ෂක මණ්ඩල තීරණය මත අඹතලේ වැලි විකිණුම් මධ්‍යස්ථානය 2023.07.31 වන දිනෙන් වසා දැමූ හෙයින් අපේක්ෂිත විකුණුම් ධාරිතාවය සඳහා ලභා වීමට නොහැකි විය.

- හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, හබරණ, මින්නේරිය වැලි විකුණුම් මධ්‍යස්ථාන වලින් 2023 වර්ෂයේ අපේක්ෂිත ආදායම ඉපැයීමට නෙහැකි වීමට පහත සඳහන් කරුණු බලපාන ලදි.

01.2023 වර්ෂයේ ඉන්ධන මිල හා ඉදිකිරීම් ද්‍රව්‍ය වල (සිමෙන්ති හා කම්බි) මිල ඉහල යාම හේතුවෙන් විකුණුම් මධ්‍යස්ථානවල අපේක්ෂිත වැලි විකුණුම් කටයුතු සිදු කිරීමට අපහසු වීම.
02. වැලි විකුණුම් මධ්‍යස්ථාන අවට පුද්ගලික වැලි විකුණුම් මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර ලබා දීම හේතුවෙන් ආයතනය මඟින් විකිණීමට තීරණය ගන්නා ලද මිලට අඩුවෙන් මෙම පුද්ගලික විකුණුම් මධ්‍යස්ථාන මඟින් වැලි අලෙවි කිරීම නිසා ඉහත වැලි විකුණුම් මධ්‍යස්ථානවල අපේක්ෂිත වැලි විකුණුම් කටයුතු සිදු කිරීමට අපහසු වීම.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ආයතනයේ කළමනාකාරීත්වය මඟින් 2023.06.30 වන දින සිට මෙම විකුණුම් මධ්‍යස්ථාන වල විකුණුම් කටයුතු නතර කරන ලදි.

2023 වර්ෂයේ කැණීම් අංශයේ ව්‍යාපෘතින් තුලින් මිලියන 76.76 ක අදායමක් උපයාගැනිමට අපේක්ෂා කලද රටේ පැවති ඉන්ධන හිඟය හා රට තුළ පැවැති ආර්ථික අස්ථාවරත්වය මත 2023 වර්ෂය තුල මිලියන 51.77 ක අදායමක් පමණක් උපයා ගැනිමට කැණීම් අංශය සමත් විය. එහිදී 2023 වර්ෂය තුල අපේක්ෂිත ආදායමට සාපේක්ෂව වියදමද අවම කිරීම තුලින් ලාභාංෂයක් කරා ගමන් කිරීමට කැණීම් අංශය සමත් වී ඇත.

2023 වර්ෂයේ භූ විද්‍යා අංශයෙහි ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති සිදු කිරීම තුලින් රුපියල් මිලියන 83.01 ක පමණ මුදලක් ළගාකර ගැනීමට අරමුණ කර පැවතියත්, භූ විද්‍යා අංශයට ළගාකර ගත හැකි වූයේ රුපියල් මිලියන 11.02 කි.

ඉහත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබුවේ ඉදිරි වර්ෂය සඳහා ව්‍යාපෘති අවස්ථා අනුමාන කිරීමෙන් වන අතර, භූ විද්‍යා අංශය සතුව ස්ථීර ව්‍යාපෘති අවස්ථා කිසිවක් නොමැත.

රටේ පැවති ආර්ථික අර්බුධය ඉහත සමාලෝචිත වර්ෂය තුල අවසන් නොවීම, වැට් බදු වැඩි වීම හේතුවෙන් නව ව්‍යාපෘති ආරම්භ නොවීම, ආර්ථික අර්බුධය හේතුවෙන් නතර කරන ලද ව්‍යාපෘති නැවත ආරම්භ නොවීම සහ රටේ පැවති ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් විදෙස් ආයෝජකයන් නොපැමිණීම වැනි කරුණු හේතුවෙන් භූ විද්‍යා අංශයට අනුමාන කරන ලද ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි වූ අතර බලාපොරොත්තු වූ ආදායමද ළගාකර ගත නොහැකි විය.

භූ විද්‍යා අංශය වශයෙන් අප උපදේශන සේවාවන් පමණක් ලබාදෙන අතර අලෙවිකරණ වැඩ කටයුතු සිදු නොකරනු ලබන බැවින් සමාගමේ ආදායම් වර්ධනය කරගැනීම සඳහා උපායමාර්ග හඳුනාගෙන හා අලෙවිකරණ සැලසුම් සකස් කිරීම සිදු නොකරයි.

(ඔ) ලෝඩර් යන්ත්‍රය අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම යන කරුණු දෙකෙන් වඩාත්ම ආර්ථික වශයෙන් වාසි දායි තීරණය පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් දීර්ඝ කාලීන අධ්‍යයනයකින් පසු ලෝඩර් යන්ත්‍රය විකුණුම් කිරීමට 2024/01/26 දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කර ඇත. එහිදී අධ්‍යක්ෂක මණ්ඩලය ලබාදී ඇති උපදෙස් අනුව ලෝඩර් යන්ත්‍රයේ මිල තක්සේරු කිරීමේ කාර්ය මානව සම්පත් හා පරිපාලන අංශය මඟින් ක්‍රියාත්මක කරමින් පවති.

(ඕ) මෝටර් සයිකලය සහ බහාලූමක් අස්ථානගතවීම සම්බන්ධවයි.

මේ සම්බන්ධව ආයතනයේ අභ්‍යන්තර කමිටුවක් පත් කර ඇති අතර මේ වන විට ඒ සම්බන්ධව කටයුතු කරමින් පවතී.

(ක) අලෙවිකරන සහ සැලසුම් කලමනාකර තනතුර සමග මානව සම්පත් හා පරිපාලන කළමනාකරු සහ නීති කළමනාකරු යන තනතුරු සඳහා දැන්වීමක් පල කල අතර අලෙවිකරන හා සැලසුම් කළමනාකරණ තනතුරට හැර අනෙකුත් තනතුරු දෙකට මේ වන විට කළමනාකරුවන් දෙදෙනෙකු පත් කර ඇත.

අලෙවිකරණ හා සැලසුම් කළමනාකරණ තනතුර දැනට ආයතනයට අවශ්‍ය තනතුරක් ලෙස හඳුනාගෙන ඇත. එහෙත් දැනට අලෙවිකරණ අංශයේ සේවය කල නිලධාරිනියකටු සැලසුම් /සම්බන්ධීකරණ තනතුරට ස්ථිර පත්වීමක් ලබා දුන්නද ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය එම තනතුරෙහි වලංගුභාවය පිළිබඳව ගැටළු සහගත බැවින් මේ වන විට එම තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවන ලෙස මානව සම්පත් අංශයට උපදෙස් ලබාදී ඇති අතර මේ මේ වන විට අයදුම්පත් කැඳවා අවසන් බවත් ඉතා ඉක්මනින් අදාල සම්මුඛ පරීක්ෂණ බලපොරොත්තු වන බවත් දන්වමි.

මීට ඉහතදී අයදුම්පත් කැඳවා මෙම තනතුරට බඳවා නොගැනීමට හේතුවූයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම තනතුරට බඳවා ගැනීම ප්‍රමාද කරන ලෙස දන්වා තිබූ හෙයින් වන අතර එමෙන්ම රාජ්‍ය වියදම් පාලනය පිලිබඳ නිකුත් කර තිබූ චක්‍රලේඛය මත පදනම්ව වේ.

(ග) සමාගම 2023 ඔක්තෝබර් 09 වන දින සිට බල පැවැත්වෙන පරිදි 35 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් ස්ථිර කර තිබුණි.

I. ආයතනයේ අංශ ප්‍රධානීන් හට ගූගල් (Google Form) මගින් තම අංශයේ සේවය කරන සේවක සේවිකාවන්ගේ කාර්යය සාධන වාර්තාවක් (Evaluation Form) සිදු කරන ලෙස දන්වා ඇත. මෙම Google Form මගින් සේවකයින්ගේ සේවා පළපුරුද්ද සම්බන්ධව හෝ ඔවුන්ගේ තනතුරු සම්බන්ධව සුදුසුකම් සලකා බැලීමක් දක්නට නොමැත.

සේවකයින් ස්ථිර කිරීම පිළිබඳව ගැටලූකාරී තත්වයක් දක්නට ලැබෙන බැවින් මේ සම්බන්ධව 2024.03.18 දින පැවත්වූ අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී එම කමිටුව මගින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණය පවත්වන ලෙස ආයතනයේ සභාපතිවරයට දන්වා ඇති අතර දැනට ඒ සම්බන්ධව කටයුතු කරමින් පවතී.

II. මේ සම්බන්ධව කමිටුවක් මගින් පරීක්ෂණයක් සිදු කරමින් පවතී.